" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකතන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකතන / பொதுவான இலக்கம் / General Telephone 011 - 2093000

SLSI ISO 9001 — SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2023 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. දිනය / திகதி / Date 2023.06. 06

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.05.23 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2023.05.14<br>රා.ප.චක්‍රලේඛ 08/2023 හා<br>2023.05.17<br>රා.ප.චක්‍රලේඛ 08/2023 (I) | ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායයන් හා මාර්ග සිතියම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම. |

02. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 08/2023

මගේ අංකය : MPA/IAD/ADM/GA19/OTHER
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2023.05.14

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ප්‍රධානීන් වෙත

**ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායයන් හා මාර්ග සිතියම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

බලශක්ති ක්ෂේත්‍රය තිරසාර අන්දමින් සංවර්ධනය කිරීම අරමුණු කරගනිමින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්තීන් හා උපාය මාර්ග හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ එහි නිර්දේශ මත පදනම්ව අමාත්‍ය මණ්ඩලය විසින් එළඹෙන තීරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම හා පසුවිපරම් කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමාගේ සභාපතීත්වයෙන් යුත් ‘ඉදිරි දශකය සඳහා ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායයන් හා මාර්ග සිතියම සම්බන්ධයෙන් පත් කල අමාත්‍ය මණ්ඩල අනුකමිටුව’ සකස් කළ වාර්තාවේ අඩංගු නිර්දේශ අංක 02 ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය අංක අමප/22/2048/602/019 හා 2023.01.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී ඇත.

02. අමාත්‍ය මණ්ඩල අනුකමිටු වාර්තාවේ නිර්දේශ අංක (1) අනුව, 2019 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග නිල ලේඛනය කාලීන අවශ්‍යතාවය පරිදි සමාලෝචනය කර යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය නියෝග හා උපදෙස් අඩංගු චක්‍රලේඛ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරනු ඇත.

03. එමෙන්ම මෙම කරුණට අදාලව 2022.03.07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹී තීරණයට අනුව නිකුත් කරන ලද 2022.03.08 දිනැති රා.ප.ච. 04/2022 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එකී චක්‍රලේඛයේ සඳහන් විදුලිය සහ ඉන්ධන පරිභෝජනය නිසි අයුරින් සිදු වන්නේ ද යන්න සොයා බැලීම සඳහා සෑම ආයතනයකටම බලශක්ති කළමනාකරුවෙකු වශයෙන් මාණ්ඩලික නිලධාරියෙකු පත් කළ යුතුව ඇත.

04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/ 2022 මගින් ක්‍රියා කිරීමට නියෝග කරන ලද යෝජනා නිසි පරිදි ක්‍රියාත්මකවීම මෙම අමාත්‍යාංශය මඟින් නියාමනයට ලක් කිරීම සිදු කරන අතර ඒ සඳහා 2022.06.30 දින සිට 2022.12.31 දක්වා මාස 06 ක ජලය, විදුලිය, ඉන්ධන, දුරකථන පරිභෝජනය පිළිබඳ දත්ත වාර්තාවක් (මාසික ඒකක ගණන) 2023.06.31 දිනට පෙර රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට ලබාදීමට කටයුතු කළ යුතුය. (අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු සහ ආයතනවල තොරතුරු මීට ඇතුළත්විය යුතුය.) ඉන් පසු ඉහත ආකාරයටම විදුලිය, ජලය, ඉන්ධන හා දුරකථන වෙනුවෙන් භාවිතා කරන ලද මාසික ඒකක ගණන ඇතුලත් තොරතුරු වාර්තාවක් කාර්තුමය වශයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන පරිපාලන අමාත්‍යාංශයට එවීමට කටයුතු කළ යුතුය.

05. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග නිල ලේඛනය, එය යාවත්කාලීන කිරීම උදෙසා ඔබ අමාත්‍යාංශ විෂයපථය යටතේ එක් කරනු ලබන සංශෝධන සහ අමාත්‍ය මණ්ඩල අනුකමිටු වාර්තාව පදනම් කරගෙන බලශක්ති ක්ෂේත්‍රයට අදාළව ඔබ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට හඳුනාගත් සියලුම කාර්යයන් හා කර්තව්‍යයන් අඩංගු කර 2023 වසරේ ඉදිරි මාස 06 සඳහා කෙටිකාලීන සැලසුම (2023 ජුනි – 2023 දෙසැම්බර්), මධ්‍යකාලීන සැලසුම (2023 – 2025) හා දීර්ඝකාලීන සැලසුම (2023 – 2030) වශයෙන් උපායමාර්ගික කළමනාකරණ සැලසුම් තිරසර සංවර්ධන අරමුණුවලට අනුකූලව සකස් කරන ලෙස මෙයින් උපදෙස් දෙමි.

06. ඒ අනුව, ප්‍රථමයෙන් ම, වර්ෂ 2023 හි ඉදිරි මාස 06 සඳහා කෙටි කාලීන උපායමාර්ගික කළමනාකරණ සැලසුම් ඔබ අමාත්‍යාංශයට සහ ඒ යටතේ පවතින සියලුම දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන සඳහා වෙන් වෙන් වශයෙන් සකස් කිරීම කළ යුතුය. එම කෙටිකාලීන උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම තුළින් පැහැදිලි ඉලක්කගත ප්‍රතිඵල ඔබ අමාත්‍යාංශය අත්පත් කර ගැනීම දැඩිව අපේක්ෂා කරමි. එසේම, එක් එක් ආයතනවල කෙටිකාලීන උපායමාර්ගික සැලසුම් ඒකාබද්ධ කර ඔබ අමාත්‍යාංශයේ බලශක්ති ක්ෂේත්‍රයේ මාධ්‍ය කාලීන හා දිගු කාලීන උපායමාර්ගික කළමනාකරණ සැලැස්ම ඇමුණුමේ දක්වා ඇති ආකෘති පත්‍රයට අනුකූල ලෙස සකස් කර අග්‍රාමාත්‍ය ලේකම්වරයාට හා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ට පිටපත් සහිතව මා වෙත 2023.05.31 දිනට හෝ ඊට ප්‍රථමව යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

07. මෙම උපාය මාර්ග සැකසීමේදී සූර්ය බලය ආදී පුනර්ජනනීය බල ශක්ති ප්‍රභවයන් භාවිතය සහ බල ශක්තිය අඩුවෙන් උපයෝජනය වන උපකරණ භාවිතය කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කළ යුතුය.

08. මේ පිළිබඳ වැඩිදුරටත් තොරතුරු අවශ්‍ය වන්නේ නම් මෙම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභ්‍යන්තර පාලන) සී.පී.යු.හෙට්ටිආරච්චි මහතා සම්බන්ධ කර ගත හැකිය.

දුරකථන අංකය :- 0112692633

09. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ හා අග්‍රාමාත්‍ය කාර්යාලයේ එකඟත්වය ඇතිවය.

කේ.ඩී.එන්.රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන අංකය :- 011-2696478
ෆැක්ස් අංකය :- 011-2692158
විද්‍යුත් ලිපිනය :- ade-iii@pubad.gov.lk

**ඇමුණුම**

| ………………………………………………………………අමාත්‍යාංශය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| # | Ministry, Department or State-Owned Institution<br>අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හෝ ව්‍යවස්ථාපිත ආයතනය<br>(1) | Short - term (For remaining 09 months in 2023) Strategic Management Plan for Energy Sector<br>බලශක්ති ක්ෂේත්‍රය සඳහා කෙටිකාලීන (ඉදිරි මාස 09 – 2023) උපායමාර්ගික කළමනාකරණ සැලසුම | | | | | | | |
| | | Goal<br>පරමාර්ථය<br>(2) | Strategy<br>ක්‍රමවේදය<br>(3) | Programme or Project or Activity<br>වැඩසටහන හෝ ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකම<br>(4) | Results of Programme or Project or Activity<br>වැඩසටහන හෝ ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකමේ අපේක්ෂිත ප්‍රතිඵල<br>(Output, Outcome, Impact)<br>(5) | Responsibility<br>වගකීම<br>(6) | Duration<br>කාලරාමුව<br>(7) | | |
| | | | | | | | Q - 2 | Q - 3 | Q - 4 |
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |

| ………………………………………………………………අමාත්‍යාංශය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| # | Ministry, Department or State-Owned Institution<br>අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හෝ ව්‍යවස්ථාපිත ආයතනය<br>(1) | Mid- term (2023 - 2025) Strategic Management Plan for Energy Sector<br>බලශක්ති ක්ෂේත්‍රය සඳහා මධ්‍යකාලීන (2023 – 2025) උපායමාර්ගික කළමනාකරණ සැලසුම | | | | | | | |
| | | Goal<br>පරමාර්ථය<br>(2) | Strategy<br>ක්‍රමවේදය<br>(3) | Programme or Project or Activity<br>වැඩසටහන හෝ ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකම<br>(4) | Results of Programme or Project or Activity<br>වැඩසටහන හෝ ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකමේ අපේක්ෂිත ප්‍රතිඵල<br>(Output, Outcome, Impact)<br>(5) | Responsibility<br>වගකීම<br>(6) | Duration<br>කාලරාමුව<br>(7) | | |
| | | | | | | | 2023 | 2024 | 2025 |
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |

| ………………………………………………………………අමාත්‍යාංශය | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| # | Ministry, Department or State-Owned Institution<br>අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හෝ ව්‍යවස්ථාපිත ආයතනය<br>(1) | Long-term (2023 – 2030 in line with the Sustainable Development Goals) Strategic Management Plan for Energy Sector<br>බලශක්ති ක්ෂේත්‍රය සඳහා දීර්ඝකාලීන (2023 – 2030 තිරසර සංවර්ධන අරමුණුවලට අනුකූලව) උපායමාර්ගික කළමනාකරණ සැලසුම | | | | | | | | | | | | |
| | | Goal<br>පරමාර්ථය<br>(2) | Strategy<br>ක්‍රමවේදය<br>(3) | Programme or Project or Activity<br>වැඩසටහන හෝ ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකම<br>(4) | Results of Programme or Project or Activity<br>වැඩසටහන හෝ ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකමේ අපේක්ෂිත ප්‍රතිඵල<br>(Output, Outcome, Impact)<br>(5) | Responsibility<br>වගකීම<br>(6) | Duration<br>කාලරාමුව<br>(7) | | | | | | | |
| | | | | | | | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 |
| 1 | | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | | |